මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.04.04

චක්‍රලේඛ අංකය : DFD/ 2024 - I

ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

## අඩු ආදායම්ලාභී පවුල් වෙත බෙදාදීම සඳහා අවශ්‍ය සහල් මිලදී ගැනීම

2023 වසරේ මුල්භාගයේදී රටේ පැවති අතිශය දුෂ්කර ආර්ථික තත්ත්වය හමුවේ බලපෑමට ලක්වූ අඩු ආදායම්ලාභී කණ්ඩායම්වල පෝෂණ මට්ටම පවත්වා ගැනීමට සහාය ලබාදෙමින් එම ජනතාව ආරක්ෂාකර ගැනීමේ අරමුණ ඇතිව මුළු රටම ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභී පවුල් මිලියන 2.74ක් පමණ ප්‍රමාණයක් වෙත එක් පවුලකට මාසයකට නාඩු සහල් කිලෝග්‍රෑම් 10ක් වන පරිදි මාස 02ක කාලයක් සඳහා සහල් ලබාදීමට රජය විසින් කටයුතු කරන ලදී. මෙම වැඩසටහන ප්‍රමුඛ කාර්යයක් සේ සලකා ඔබ සියලුදෙනා විසින් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදෙන ලද ඉහළ දායකත්වය ඉතා අගය කරමි.

අඩු ආදායම්ලාභී පවුල්වල පෝෂණ තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ඔවුන්ට සහනයක් වශයෙන් සහල් බෙදාදීම උදෙසා අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 'අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම' මැයෙන්වූ අංක: 24/0645/601/038-I දරන 2024.04.01 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි යෝජනා සඳහා 2024.04.01 දිනැති තීරණය මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. මෙම අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2024 වසරේදී ද අඩු ආදායම්ලාභී පවුල් සඳහා මාසයකට කිලෝග්‍රෑම් 10 බැගින් මාස 02ක කාලයක් සඳහා නාඩු සහල් ලබාදීමට තීරණය කර ඇති බැවින් ඒ සඳහා අවශ්‍යවන සහල් දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් හැකියාව ඇති සහල් සැපයුම්කරුවන්ගෙන් මිලට ගැනීම පහත මාර්ගෝපදේශ යටතේ සිදුකළ යුතුය.

### 2.0 සහල් මිලදී ගැනීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ එක් එක් දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභී පවුල් තෝරාගැනීමේ උපදෙස් ද සහිතව සහල් බෙදාහැරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ චක්‍රලේඛය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබේ. ඒ අනුව, අදාළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව තීරණය කිරීමෙන් අනතුරුව, තම දිස්ත්‍රික්කයේ හඳුනාගන්නා ලද අඩු ආදායම්ලාභී පවුල් වෙත ලබාදීමට ප්‍රමාණවත් නාඩු සහල් තොග මිලදී ගැනීම හා ගබඩා කිරීම අදාළ දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරේ.

සහල් මිලදී ගැනීම්වලට හා ගබඩා කිරීම්වලට අදාළ ලේඛන පවත්වාගෙන යාමේ සහ ගිණුම්ගත කිරීමේ වගකීම සහල් තොග මිලදීගනු ලබන දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරේ.

## 2.1 අරමුදල් සම්පාදනය හා ඉතිරි වන ශේෂයන් පියවීම

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් ඉහත 2.0 යටතේ අනුමත අඩු ආදායම්ලාභී පවුල් වෙත සහල් ලබාදීමට අවශ්‍ය සහල් මිලදී ගැනීම සඳහා වන අරමුදල් අවශ්‍යතාවය දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු අතර ඒ අනුව, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් සෘජුවම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත භාණ්ඩාගාර අරමුදල් වෙන්කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවටත් අක්මුදල් නිදහස් කිරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවටත් නිර්දේශ ලබා දෙනු ඇත. ඒ අනුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත සෘජුවම අයවැය ප්‍රතිපාදන ලබාදෙනු ඇති අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත සහල් මිලදී ගැනීම සඳහා අක්මුදල් නිදහස් කරනු ඇත.

සහල් මිලදී ගැනීමේ වැඩසටහන සඳහා වන අරමුදල්, අවශ්‍යතාවය පරිදි මහා භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කිරීම සිදු කරන අතර, එම අරමුදල්වල ඉතිරිව පවතින ශේෂයන් සහල් මිලදී ගැනීමේ කටයුතු නිමකළ වහාම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඇති නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුම වෙත පියවා, ඒ සම්බන්ධයෙන් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතුය. එසේ ඉතිරිව පවතින මුදල් වෙනත් කිසිදු කාර්යයක් සඳහා යොදානොගැනීමට අදාළ දිස්ත්‍රික් ලේකම් විසින් වගබලාගත යුතුය.

## 2.2 සහල් මිලදී ගැනීමේ සහතික මිල

පහත මිල ගණන්වලට කිලෝග්‍රෑම් 10 බෑග් වශයෙන් සහල් මිලදී ගැනීම සිදුකළ යුතුය.

| සහල් වර්ගය | සහල් මිලදී ගැනීමේ මිල (කිලෝග්‍රෑම් 10 ක බෑගයක් සඳහා රුපියල්) |
|---|---|
| නාඩු - තම්බන ලද | 1,900.00 |
| නාඩු - කැකුළු | 1,860.00 |

## 2.3 සහල් තොග මිලදීගැනීම, භාර ගැනීම, ගබඩාකර තැබීම හා ප්‍රවාහනය

2.3.1 සහල් මිලදී ගැනීමේ ක්‍රියාවලිය තුළ නිසි ප්‍රමිතියෙන් යුතු සහල් තොග මිලදී ගැනීම, භාර ගැනීම, ගබඩා කිරීම සහ ඊට අදාළ ලේඛන පවත්වා ගැනීම, ගිණුම් ගත කිරීම සහ ගබඩා තුළ නියමිත සහල් තොග පවතින්නේද යන්න තහවුරු කර යාවත්කාලීන කිරීම පිළිබඳ වගකීම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරේ.

2.3.2 දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ඇතිව සැපයුම්කරුවන්ගෙන් 2.2 හි දක්වා ඇති මිල ගණන් යටතේ නිසි ප්‍රමිතියෙන් යුත් සහල් මිලදී ගත යුතුය. සහල් බෙදාදීමේ වැඩසටහන 2024 අප්‍රේල් හා මැයි මාස තුළදී ක්‍රියාත්මක කිරීමට නියමිත බැවින්, අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරු විසින් තම දිස්ත්‍රික්කයේ සිටින සුදුසු සැපයුම්කරුවන් වැඩසටහනට සම්බන්ධ කරගත යුතු අතර, මෙහිදී එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශට අවශ්‍ය සහල් තොග මිලදී ගැනීමට එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉදිරිපත් වන සැපයුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. සහල් මිලදීගැනීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලභාවය තහවුරු වන පරිදි එම සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්ගතවීමට දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් කටයුතු කළ යුතුය.

මීට පෙර කන්නවල දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින් ක්‍රියාත්මක කළ වී මිලදී ගැනීමේ වැඩසටහන් සඳහා සම්බන්ධ වූ වී මෝල්හිමියන්/සමුපකාර සමිති සහල් සැපයීම සඳහා සහභාගිවීමට අපේක්ෂා කරන්නේ නම්, එම කන්නවලදී මිලදී ගත් වී තොග සියල්ලම සහල් කර මේ වන විට භාරදී තිබිය යුතුය. එසේම, **මීට පෙර කන්නවලදී වී මිලදී ගැනීමේ වැඩසටහන්වලට සහභාගීවී නියමිත සහල් තොග හෝ එහි වටිනාකම මුදලින් මේවනතෙක් භාරනොදුන්, කිසිදු වී මෝල්හිමියෙකු හට මෙම වැඩසටහනට සහභාගිවීමේ අවස්ථාව හිමි නොවේ.** එසේවුවද, සියලුම හිඟ සහල් තොග හෝ හිඟ මුදල් පියවා අවසන්වීමෙන් අනතුරුව එම දින සිට අදාළ මෝල්හිමියන් මෙම වැඩසටහනට සම්බන්ධ කර ගැනීමට අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් හට කටයුතු කළ හැකිය.

2.3.3 බෙදාහැරීමට ප්‍රමාණවත් සහල් තොග නොමැති දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින්, සහල් තොග පවතින තම **දිස්ත්‍රික්කයට ආසන්නතම** දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය සහල් තොග ලබාගැනීමට කටයුතු කළ යුතුය.

2.3.4 කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් ලබාදෙන උපදෙස් මත ප්‍රතිලාභීන් වෙත අවශ්‍ය සහල් නියමිත පරිදි ලබාදීම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ වගකීම වේ. ඒ අනුව, ලබාදිය යුතු සහල් කිලෝග්‍රෑම් 10 බැගින් වන ඇසුරුම් මලු ප්‍රමාණය, දිනය සහ ස්ථානය පිළිබඳ අදාළ උපදෙස් දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සැපයුම්කරුවන් වෙත ලබා දිය යුතුය.

2.3.5 ඉහත 2.3.4 පරිදි, එම චක්‍රලේඛ උපදෙස්වලට අනුව බෙදාදීම සඳහා අවශ්‍ය සහල් අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සැපයුම්කරුවන්ගෙන් භාරගත යුතුය. නියමිත සහල් තොග භාරගත් බවට අදාළ දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් විසින් තොග ලැබීමේ නිවේදනය (GRN) සහල් සැපයුම්කරු වෙත නිකුත් කළ යුතු අතර එහි පිටපතක් දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් විසින් සුරක්ෂිතව තබාගත යුතුය. ගිවිසුම්ගත පරිදි සහල් තොග භාරගැනීමෙන් අනතුරුව අදාළ සැපයුම්කරු වෙත සහල්වල වටිනාකම ගෙවීමට දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කළ යුතුය.

2.3.6 දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් විසින් සැපයුම්කරුවන්ගෙන් සහල් තොග ලබාගැනීම සම්බන්ධ වාර්තා පවත්වාගත යුතු අතර එම සහල් තොග නිසි ප්‍රමිතියෙන් හා නිසි බරින් යුතුව ඇත්ද යන්න පිළිබඳ නිරන්තර පසුවිපරම සිදුකරමින් නිසි පරිදි තොග පවත්වාගත යුතුය. සහල් මිලදීගත් අවස්ථාවේ සඳහන් තොග පිළිබඳ වාර්තා යාවත්කාලීන කරමින් සම්පූර්ණ සහල් තොගයම බෙදාදීම සිදුකර අවසන්වන තෙක් තොග පිළිබඳ දෛනික වාර්තා පවත්වාගෙන යමින් සහල් තොගවල කිසිදු අඩුවක් නොවන බවට දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් තහවුරු කරගත යුතුය.

2.3.7 සහල් ප්‍රවාහනයේදී සැපයුම්කරුගේ ගබඩාවේ සිට කිලෝමීටර 25ක් සහල් ප්‍රවාහනය සඳහා වන වියදම සහල් මිල තුළ අඩංගු කර ඇත. සහල් ප්‍රවාහන දුර කිලෝමීටර 25 ඉක්මවන අවස්ථාවලදී, වැඩිවන දුරට සහල් මෙ.ටො. 1ක් කිලෝමීටර 1ක් ප්‍රවාහනය සඳහා රු.20ක් අදාළ සැපයුම්කරුට ලබාගැනීමට හැකියාවක් පවතී.

2.3.8 සහල් ඇසුරුම් මලු සඳහා වන පිරිවැය ආවරණය වන පරිදි සහල් මිල තීරණය කර ඇති බැවින් සහල් ඇසුරුම් මලු සඳහා අමතර මුදලක් ගෙවනු නොලැබේ.

2.3.9 මෙම වැඩසටහන සඳහා අවශ්‍ය වන මූලික අවශ්‍යතා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් කළමනාකරණය කරගත යුතුය. වැඩසටහන සම්බන්ධව අවශ්‍ය වන ප්‍රවාහන කටයුතු සඳහා රාජ්‍ය ආයතන සතුව පවතින ලොරි සහ ට්‍රක් රථ අවශ්‍යතාවය මත යොදා ගැනීමට ද කටයුතු කළ හැකිය.

2.3.10 සහල් තොග මිලදීගැනීම, ගබඩා කර තැබීම හා තම දිස්ත්‍රික්කය තුළ සහ වෙනත් දිස්ත්‍රික්කවල අඩු ආදායම්ලාභී පවුල් වෙත බෙදාහැරීමට නිකුත් කරන ලද සහල් තොග පිළිබඳ විස්තරාත්මක වාර්තා අදාළ ආයතනවලට පසුවිපරම සඳහා ලබාදිය හැකි වන පරිදි තබාගැනීම හා ගිණුම්ගත කිරීම දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් කළ යුතුය.

2.3.11 ඉහත 2.3.2 යටතේ අත්සන් කරනු ලබන ගිවිසුම්වලට අනුකූලව නියමිත සහල් තොග ලබා නොදෙන සැපයුම්කරුවන් සම්බන්ධයෙන් එම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට අදාළ දිස්ත්‍රික් ලේකම්/ප්‍රදේශීය ලේකම්වරුන් විසින් පියවර ගත යුතුය.

## 3.0 අනෙකුත් කරුණු

සහල් මිලදී ගැනීමේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් පහත පියවර ද ගත යුතුය.

3.1 එක් එක් දිස්ත්‍රික්කයේ සහල් මිලදී ගැනීමේ හා බෙදාහැරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු පත්කළ යුතු අතර එම නිළධාරියාගේ නම, තනතුර, දුරකතන අංකය සහ විද්‍යුත් ලිපිනය වැඩසටහන ආරම්භයට පෙර මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතුය.

3.2 ගබඩාවල පවතින සහල් තොග ආරක්ෂාව සඳහා අවශ්‍යතාවය මත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යොදවා ගැනීමට දිස්ත්‍රික් ලේකම්වරුන් කටයුතු කළ යුතු අතර රැස්කරන ලද සහල් තොග සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාම පිළිබඳව පසුවිපරම් කළ යුතුය.

3.3 වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී වන මෙහෙයුම් වියදම් අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ අනුමැතීන්ට යටත්ව සිදුකිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් පියවර ගත යුතු අතර මේ සම්බන්ධයෙන් යම් ගැටළු පැනනඟින අවස්ථාවලදී ඒ සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් විමසා කටයුතු කළ යුතුය.

3.4 සහල් මිලදී ගැනීමේ හා අරමුදල් භාවිතා කිරීමේ දෛනික ප්‍රගතිය **ඇමුණුම 01** පරිදි ද, සහල් බෙදාදීමේ දෛනික ප්‍රගතිය **ඇමුණුම 02** පරිදි ද සකස්කර මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. මෙහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ තොරතුරු නිවැරදිව ලබාගනිමින් එම තොරතුරු යාවත්කාලීන කිරීම හා වාර්තා කිරීම පිළිබඳ යාන්ත්‍රණයක් සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ පවත්වාගත යුතු අතර සහල් තොග තොරතුරු වරින්වර වෙනස් නොවන පරිදි නිවැරදිම තොරතුරු පමණක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

3.5 සහල් මිලදී ගෙන බෙදාහැරීම අවසන් වූ දිනට පසුව අදාළ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් මිලදී ගත් සහල් තොග සහ භාවිතා වූ අරමුදල්වල විස්තරාත්මක සටහනක් **ඇමුණුම 03** අනුව සකසා දිස්ත්‍රික් ලේකම්ගේ අත්සනින් යුතුව මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවට ලබාදිය යුතුය.

3.6 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ජාතික ප්‍රමුඛතාවයක් සේ සළකා රජයේ වියදම අවම වන පරිදි සහ අඩු ආදායම්ලාභී පවුල්වලට උපරිම සහන සැලසෙන පරිදි සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත රාජ්‍ය සේවයම කැපවීමෙන් ආදර්ශමත්ව කටයුතු කළ යුතුව ඇත.

සහල් බෙදාදීමේ වැඩසටහන සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතා වැඩිදුර විස්තර ලබාගත හැකිය (දුරකතන අංක : 011-2484542, 011 – 2484595 හා 011 – 2484596 විද්‍යුත් තැපැල: dgdf@dfd.treasury.gov.lk, kumara.shv@dfd.treasury.gov.lk, thushari.wan@dfd.treasury.gov.lk හා dfdmofdata2015@gmail.com).

කේ.එම්.මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු.දැ.ගැ.ස.
2. ලේකම්, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස සහ අ.ක.ස.
4. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
5. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
6. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
7. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
8. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
9. කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
10. සභාපති, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
11. අධ්‍යක්ෂ, ජාතික පසු අස්වනු තාක්ෂණ ආයතනය - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
12. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.ස.

Annexure 01

## Rice Distribution for Low-income Families - April/May 2024

## Purchasing progress as at .........................2024

**District :** .......................................................

| # | Supplier information | | | Rice quantity purchased (No of 10kg bags) | | | Expenditure for purchased Rice (Rs) | | | Remarks |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Name | Address | NIC Number | Nadu Raw Rice | Nadu Par-boiled | Total | Nadu Raw Rice | Nadu Par-boiled | Total | |
| | *(A)* | *(B)* | *(C )* | *(D)* | *(E)* | *(F)=(D+E)* | *(G)* | *(H)* | *(I)=(G+H)* | *(J)* |
| 1 | | | | | | | | | | |
| 2 | | | | | | | | | | |
| 3 | | | | | | | | | | |
| .... | | | | | | | | | | |
| .... | | | | | | | | | | |
| .... | **Total** | | | | | | | | | |

**Certification**

I /We hereby certify that the above details of the purchasing and distribution of rice and related cost under the Rice Distribution programme in ...................... district.

............................
Prepared by

Name :
Designation :
Date :

............................
Checked by

Name :
Designation :
Date :

............................
Approved by

Name :
Designation :
Date :

Annexure 02

## Rice Distribution for Low-income Families - April/May 2024

## Distribution progress as at ........................2024

| District | 1st phase | | | 2nd phase | | |
|---|---|---|---|---|---|---|
| | No. of Benificiary families to be recieved rice | No. of Benificiary families recieved rice | Quantity distributed (No of 10kg bags) | No. of Benificiary families to be recieved rice | No. of Benificiary families recieved rice | Quantity distributed (No of 10kg bags) |
| | | | | | | |

**Certification**

I /We hereby certify that the above details of the distribution of rice under the Rice Distribution programme in ............................ district.

| ............................ | ............................ | ............................ |
|---|---|---|
| Prepared by | Checked by | Approved by |
| Name : | Name : | Name : |
| Designation : | Designation : | Designation : |
| Date : | Date : | Date : |

Annexure 03

## Rice Distribution for Low-income Families - April/May 2024
## Final report on Purchasing paddy, receiving rice and settling Funds

**District : ......................................................**

| # | Supplier information | | | Rice quantity purchased (No of 10kg bags) | | | Payments for Rice suppliers (Rs) | | | Remarks |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Name | Address | NIC Number | Nadu Raw Rice | Nadu Par-boiled | Total | Nadu Raw Rice | Nadu Par-boiled | Total | |
| | *(A)* | *(B)* | *(C )* | *(D)* | *(E)* | *(F)=(D+E)* | *(G)* | *(H)* | *(I)=(G+H)* | *(J)* |
| 1 | | | | | | | | | | |
| 2 | | | | | | | | | | |
| 3 | | | | | | | | | | |
| .... | | | | | | | | | | |
| .... | | | | | | | | | | |
| .... | **Total** | | | | | | | | | |

| Description | Rs. |
|---|---|
| Allocation received | |
| **Imprest received** | |
| **Expenditure** | **0.00** |
| *Rice purchasing cost* | |
| *Rice distribution cost* | |
| *Other cost* (mentione pls.)* | |
| **Balance** | **0.00** |

**(To be settled to the TOD with a copy to DFD)**

**Certification**

I /We hereby certify that the above details of the purchasing and distribution of rice and related cost under the Rice Distribution programme in .................................... district.

............................
Prepared by

Name :
Designation :
Date :

............................
Checked by

Name :
Designation :
Date :

..................................................
Approved by District Secretary